# ඔටාවා සම්මුතියට ලංකාව අස්සන් කළොත් අවතැන් ජනතාවට විශාල සහනයක්

## ශ්‍රී ලංකා ජාතික සංගමය

සාමය උදා වී ඇති මෙම අවස්ථාවේ බිම් බෝම්බ, පොකුරු බෝම්බ ඇතුළු විනාශකාරී ආයුධ තුරන් කිරීමේ ජාත්‍යන්තර ඔටාවා සම්මුතියට නිල වශයෙන් අස්සන් තැබීමට ශ්‍රී ලංකා රජයට හැකි විය යුතු යැයි ශ්‍රී ලංකා ජාතික සංගමය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

මානුෂික ගුණාංග යළි ඇති කරන්නට පොළඹවන මෙම ඔටාවා සම්මුතියට අස්සන් නොතැබීමට රටට කිසිදු හේතුවක් නැති බව ද ශ්‍රී ලංකා ජාතික සංගමයේ නායක අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා විසින් නිකුත් කරන ලද එම නිවේදනයේ වැඩිදුරටත් සඳහන්ය.

එම නිවේදනයේ මෙසේද සඳහන් කර ඇත.

ඔටාවා සම්මුතිය නිල වශයෙන් 1997 දෙසැම්බර් 03වැනිදා ප්‍රකාශයට පත් විය. එය 1999 මාර්තු 01 වැනිදා සිට ක්‍රියාත්මක වූ අතර එම වසරේ මැයි මාසය වන විට ලොව පුරා රටවල් 156ක් එකඟතාව පළ කරමින් අස්සන් කර තිබිණ. රටවල් දෙකක් තවමත් මෙම ගිවිසුමට අස්සන් කර එහෙත් එය යථා පරිදි ක්‍රියාත්මක කරන්නට අසමත්ව ඇති අතර, ලෝකයේ රටවල් තිස් හතක් මෙම ඔටාවා සම්මුතියට මෙතෙක් අස්සන් තබා නැත. ගිවිසුමට අස්සන් තබන රටවල් වසර දහයක් ඇතුළත සම්පූර්ණයෙන්ම බිම් බෝම්බවලින් තොර විය යුතු යැයි සැලකේ.

මානුෂික වශයෙන් වැදගත් බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය 2002 වසරේදී මෙරට ආරම්භ වී ඇත. දහස් ගණනක් බිම් බෝම්බ ඒවා වළලන ලද ප්‍රදේශවලින් ඉවත් කර අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරන්නට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ. එසේ පදිංචි කරන ලද ප්‍රදේශවලින් බිම් බෝම්බ නිසා කිසිදු පුරවැසියකුට අනතුරක් නොවීම මෙම වැඩපිළිවෙළෙහි සාර්ථකත්වය පෙන්නුම් කරන බව මෙම නිවේදනයෙන් දක්වන අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා, ගැටුම් පැවැති ප්‍රදේශවල තවත් ඉඩම් අක්කර සිය ගණනක බිම් බෝම්බ ඉවත් කිරීමේ භාරධූර වගකීම ඉතිරිව ඇති බව ද පෙන්වා දෙයි.

ඔටාවා සම්මුතියට නිල වශයෙන් අස්සන් කිරීමෙන් පසු අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ රජයේ වෑයම කඩිනම් කරමින් තවදුරටත් ඉතිරිව ඇති විනාශකාරී බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යයට ජාත්‍යන්තරව ලැබෙන සහය බෙහෙවින් වැඩි විය හැකි බව ද පෙන්වා දෙන මිලින්ද මොරගොඩ මහතා, එය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තරව ප්‍රසාදය හා කීර්තිය ඉහළ නංවන අවස්ථාවක් බව ද අවධාරණය කරයි.